2021.11.24
BUSL/EX/02

# දැන්වීමයි.

**සියළුම විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ දැනගැනීම සඳහා**

## විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කොවිඩ් 19 වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පිළිපැදිය යුතු පොදු සෞඛ්‍ය මාර්ගෝපදේශ

රට තුළ පැතිරී යන කොරෝනා ව්‍යාප්තිය හේතුවෙන් උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතුවලට සිදු වන බාධාවන් අවම කිරීමේ අරමුණින් විස්තාරිත පාඨමාලාවන්හි අවසන් විභාගය 2021 දෙසැම්බර් මස සිට ආරම්භ කිරීමට විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් සැලසුම් සකස් කර ඇත. ඒ අනුව කොරෝනා වසංගත ව්‍යාප්තිය වළක්වා ගැනීම සඳහා පහත සඳහන් සෞඛ්‍ය සීමාවන්ට අනුගතව විභාග කාලය තුළ කටයුතු කළ යුතු බවට සියළුම විභාගාපේක්ෂකයින්ට මෙයින් දැනුම් දෙමි.

1. පාඨමාලාවන්ට අදාළව අවසන් විභාග 2021 දෙසැම්බර් මස සිට ආරම්භ වන අතර සියලුම විභාග කාලසටහන් මේ වනවිට විභාගාපේක්ෂකයින් වෙත නිකුත් කර ඇත.

2. විභාග ශාලාවට පැමිණීමේ දී කොවිඩ් මර්ධන එන්නත් මාත්‍රා දෙකම ලබාගත් කාඩ්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එලෙස එන්නත ලබා නොගත් විභාග අපේක්ෂකයෙක් වේ නම් ඒ පිළිබඳව අවසන් විභාගය පැවැත්වීමට අවම සතියකට පෙර 025-2057978 දුරකථන අංකයට පෙ.ව. 09.00 සිට ප.ව. 04.00 දක්වා කාලය තුළ දැන්විය යුතුය.

3. යම් විභාගාපේක්ෂකයෙකු කෝවිඩ් - 19 රෝග ලක්ෂණ (කැස්ස, උණ, හුස්ම ගැනීමේ අපහසුව, හිසරදය...) පෙන්වයි නම් විභාගය සඳහා පැමිණීමෙන් වැළකී සිටිය යුතුය.

4. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ විභාගාපේක්ෂකයින් එක්රැස් වීමෙන් හා ඇවිදීමෙන් වැළකිය යුතු අතර සෑම විටම සෑම ස්ථානයකම මීටරයකට වැඩි ශාරීරික දුරස්ථභාවයක් පවත්වා ගත යුතුය.

5. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළට ඇතුලු වීමට හා පිට වීමට ප්‍රධාන ගේට්ටුව පමණක් භාවිත කළ යුතුය.

6. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළට ඇතුලු වනවිට ප්‍රධාන ගේට්ටුව අසල දී ආරක්ෂක අංශ විසින් ශරීර උෂ්ණත්වය පරීක්ෂා කරනු ලබන අතර ශරීර උෂ්ණත්වය $98.4^0$F/ $37^0$C ට වඩා වැඩි නම් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළට ඇතුලු වීමට අවසර නොලැබේ.

7. විභාග ශාලාවට ඇතුලු වීමට පෙර ප්‍රධාන පිවිසුම අසල දී සෑම විභාගාපේක්ෂකයෙකු විසින්ම සනීපාරක්ෂක අත් සෝදන (Hand Sanitizer) ආධාරයෙන් දෑත් පිරිසිදු කිරීම කරගත යුතුය.

8. විශ්වවිදාල පරිශ්‍රය තුළදී සෑම විභාගාපේක්ෂකයෙකු විසින්ම මුඛ ආවරණ (Face Masks) පැළඳීම අනිවාර්ය වේ.

9. ශිෂ්‍ය හැඳුනුම්පත/ විභාග ප්‍රවේශ පත්‍රය විභාග කාර්ය මණ්ඩලයට දුර සිට ප්‍රදර්ශනය වන ලෙසට සිය මේසය මත තැබිය යුතුය.

10. මීට අමතරව රජයේ සෞඛ්‍ය අංශ විසින් පනවා ඇති/ පනවනු ලබන සෞඛ්‍ය උපදෙස් හා නිරෝධායන නීති රීති වලට අනුගතව කටයුතු කළ යුතුය.

අධ්‍යක්ෂ,
පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය